පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2024.12.30 පැය 1230 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1907 /2024 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

<u>පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු</u>

## 01. කේරළ ගංජා සහ අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාසය

2024.12.29 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් කොටහේන පොලිස් වසමේ සංඝමිත්තා මාවත ආසන්න ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර කේරළ ගංජා ග්‍රෑම් 410 ක් හා අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 08 මිලි ග්‍රෑම් 60 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන කොටහේන පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 41 ක් වන කොළඹ 13 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොටහේන පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාසය.

2024.12.29 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් කොටහේන පොලිස් වසමේ සංඝමිත්තා මාවත ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 07 මිලි ග්‍රෑම් 03 ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන කොටහේන පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 46 ක් වන ජම්පටාවීදිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොටහේන පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 03. හෙරොයින් සමඟ සැකකරුවෙක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මහනුවර කඳවුර.

2024.12.29 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා මහනුවර කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් කොටහේන පොලිස් වසමේ සංඝමිත්තා මාවත ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර හෙරොයින් ග්‍රෑම් 05 මිලි ග්‍රෑම් 780

ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මහනුවර පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 39 ක් වන දෙහිවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මහනුවර පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.
.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**